# යොවුන් මලල ක්‍රීඩා පිටිය උණුසුම් වෙයි

# නව ශ්‍රී ලංකා වාර්තා 2ක් බිඳ වැටෙද්දී තරග වාර්තා 14 දක්වා ඉහළට



16න් පහළ පිරිමි මීටර් 400 කඩුලු මතින් දිවීමේ තරගය තත්පර 56. 66කින් ජයගත් මහනුවර ගේට්වේ විදුහලේ එස්.ඊ. ආරච්චි

වසර 9ක් පැරණි 18න් පහළ මීටර් 400 ශ්‍රී ලංකා වාර්තාවක් බිඳ හෙළූ කඳාන සාන්ත සෙබස්තියන් විදුහලේ ඔමෙල් සිල්වා

16න් පහළ පිරිමි මීටර් 100 සහාය නව තරග වාර්තාව බිහි කළ වෙන්නප්පුව ජෝසප් වාස් විදුහල



20න් පහළ කාන්තා කවපෙත්ත විසි කිරීම මීටර් 36.32කින් ජයගත් විජයබා මධ්‍ය මහා විදුහලේ ජේ.එච්.එස්. ජයමහා



20න් පහළ කාන්තා මීටර් 100 සහාය දිවීම නව තරග වාර්තාව බිහි කළ කොළඹ ගේට්වේ විදුහල

**ප්‍රින්ස් ගුණසේකර**

92 වැනි ශ්‍රීමත් ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියේ ඊයේ දෙවැනි දිනය නිමාවෙද්දී නව යොවුන් ශ්‍රී ලංකා වාර්තා 2ක් හා තරග වාර්තා 14ක් බිඳ වැටිණි. කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්වෙන ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය අදින් නිමාවට පත්වන අතර, අවසන් තරග කිහිපයක් පැවැත්වීමට නියමිතය.

ඊයේ දිනයේ 18න් පහළ පිරිමි මීටර් 400 ඉසව්වේ වසර 9ක් පැරණි ශ්‍රී ලංකා වාර්තාවක් බිඳ හෙළීමට කඳාන සාන්ත සෙබස්තියන් විදුහලේ ඔමෙල් සිල්වා සමත් වූ අතර, ඔහු ගත කළ කාලය වූයේ තත්පර 47.10කි. ඒ අනුව වසර 2015දී සාන්ත සෙබස්තියන් විදුහලේ නවිෂ්ක සන්දේෂ් තත්පර 48.01කින් පිහිටුවා තිබූ වාර්තාව මැකී ගියේය. ඊයේ දිනයේ මේ ඉසව්වේ දෙවැනි ස්ථානය එස්.එම්.එස්.වී. රාජකරුණා තත්පර 47.41 (වෙන්නප්පුව ජෝසප් වාස්) හා තෙවැනි ස්ථානය ඒ.අයි.එස්. එදිරිසිංහ තත්පර 48.38 (පන්නල ම. වි) දිනා ගත්හ.

පෙරේදා දිනයේදී 18න් පහළ පිරිමි මීටර් 200 තරගයේදී වෙන්නප්පුව ජෝසප් වාස් විදුහලේ එස්.එම්.වී. එස්. රාජකරුණා තත්පර 21.52කින් නව යොවුන් ශ්‍රී ලංකා වාර්තාව බිහි කළේය.

**ඊයේ බිහි වූ නව තරග වාර්තා මෙසේය:**

**16න් පහළ පිරිමි මීටර් 400**

1.ඩබ්ලිව්.එන්. විශාල් තත්පර 49.76 (වෙන්නප්පුව ජෝසප් වාස්), 2. සී. කෝස්තා තත්පර 50.30 ( කොළඹ ගේට්වේ වි), 3. එල්.එල්. ජයසිංහ තත්පර 50.48 (සර් ජෝන් කොතලාවල ජාතික පාසල)

**18න් පහළ කාන්තා මීටර් 100 සහාය දිවීම**

1. තත්පර 49.02 වත්තල ලයිසියම්, 2. තත්පර 50.07 පන්නිපිටිය ධර්මපාල, 3. තත්පර 50.41 කොළඹ ගේට්වේ

**18න් පහළ පිරිමි මීටර් 100 සහාය දිවීම**

1. තත්පර 42.74 වත්තල ලයිසියම් වි, 2. තත්පර 50.07 පන්නිපිටිය ධර්මපාල වි., 3. තත්පර 50. 41 කොළඹ ගේට්වේ

**20න් පහළ කාන්තා මීටර් 100 සහාය දිවීම**

1. තත්පර 48.49 කොළඹ ගේට්වේ, 2. තත්පර 48.85 වත්තල ලයිසියම් වි., 3. තත්පර 50.17 මහනුවර උසස් බාලිකා විදුහල

**20න් පහළ පිරිමි මීටර් 100 සහාය දිවීම**

1. තත්පර 41.45 කොළඹ ආනන්ද වි., 2. තත්පර 42.47 ගාල්ල මහින්ද වි., 3. තත්පර 42.57 කොළඹ සාන්ත බෙනඩික්ට්

**18න් පහළ පිරිමි මීටර් 100 සහාය දිවීම**

1. තත්පර 44.18 වෙන්නප්පුව ජෝසප් වාස් වි., 2. තත්පර 44.27 තිබ්බිරිගස්කටුව මාරිස්ටෙලා, 3. තත්පර 44.56 කොළඹ සාන්ත බෙනඩික්ට්

**ඊයේ දිනයේ තරග ප්‍රතිඵල කිහිපයක්:**

**20න් පහළ කාන්තා මීටර් 400**

1. ජේ. විජේතුංග තත්පර 54. 94 (වත්තල ලයිසියම් වි.), 2. කේ.ටී. නුහන්සා තත්පර 55.75 (මාතර වි.), 3. එන්.ජී.ජී. ප්‍රමුදිකා තත්පර 57.22 ( ගම්පහ සිරිකුරුස)

**20න් පහළ පිරිමි මීටර් 100**

එම්. රොෂාන් තත්පර 48.57 (මීගමුව මාරිස්ටෙලා), 2. එච්.එච්. නෙත්සර තත්පර 48.57 (කොළඹ ලුම්බිණි), 3. කේ.කේ.අයි. සිල්වා (කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය)

**16න් පහළ පිරිමි මීටර් 400 සහාය දිවීම**

1. තත්පර 44.18 වෙන්නප්පුව ජෝසප් වාස්, 2. තත්පර 44.27 මීගමුව මාරිස්ටෙලා, 3. තත්පර 44.56 කොළඹ සාන්ත බෙනඩික්ට්

**20න් පහළ පිරිමි යගුළිය විසි කිරීම (කිලෝග්‍රෑම් 6)**

1. ටී.ඩී. එස්. රත්නසිරි මීටර් 15. 04 (බළන්ගොඩ ආනන්ද විදුහල), 2. එම්.එස්. ලක්ෂාන් මීටර් 14.10 (ආණමඩුව ම. ම. විදුහල), 3. ඒ.ආර්.කේ. වීරසේන මීටර් 14.03

**20න් පහළ පිරිමි උස පැනීම**

1. ජී.එල්. අර්ථවිදු මීටර් 2.13 (කොළඹ ආනන්ද විදුහල), 2.ඩී. අනුහස් මීටර් 2.00 (වත්තල ලයිසියම්), 3. එන්. රත්නවීර මීටර් 1.95 (වත්තල ලයිසියම්)

**16න් පහළ පිරිමි තුන් පිම්ම**

1. ඒ. මිහිරංග මීටර් 13.65 (නුගේගොඩ ලයිසියම්) 2. ජී.සී.එන්. නිම්සර මීටර් 13.61 (මීරිගම ඩඩ්ලි සේනානායක වි.), 3. ඩී.එස්.ඩී. ජයසිංහ මීටර් 13.24 (කොළඹ සාන්ත බෙනඩික්ට් වි.)

**18න් පහළ පිරිමි රිටි පැනීම**

1. ඩී.එස්. දිල්නඳ මීටර් 3.90 (බෝපිටිය ලොයලා වි.), 2. එස්. කජනන මීටර් 23.80 (චාවකච්චේරිය හින්දු වි.), 3. ඩී. විහරංග මීටර් 3.60 (මීගමුව මාරිස්ටෙලා වි.)

**20න් පහළ කාන්තා හෙල්ල විසි කිරීම**

1. බී.එස්. දිව්‍යාංජලී මීටර් 35.67 (ගාල්ල සංඝසමිත්තා බා.) 2. කේ.එම්.ඒ. දෙව්මිණි මීටර් 31.60 (ගම්පහ මාස්පන්න වි.) 3. ජී.එන්. එස්. පීරිස් මීටර් 31.03 ( කුලියාපිටිය ම. ම. වි)

**18න් පහළ පිරිමි යගුළිය විසි කිරීම**

1. එච්.යූ. ජයසිංහ මීටර් 16. 83 (වෙන්නප්පුව ජෝසප් වාස්), 2. යූ.ඩී.ආර්. ප්‍රනාන්දු මීටර් 14.21 (වෙන්නප්පුව ජෝසප් වාස්), 3. ටී. බොනිෆස් මීටර් 13.95 (වත්තල ඕ.කේ.අයි)

**20න් පහළ කාන්තා උස පැනීම**

1. ඩී.කේ.ටී. ජයරත්න මීටර් 1.68 (කුරුණෑගල ජනාධිපති බා. වි.), 2. කේ.බී.ඩී. වාසනා මීටර් 1.60 (රත්නපුර සුමනා බා.), 3. එන්. රණසිංහ මීටර් 1.50 ( වත්තල ලයිසියම්)

**16න් පහළ කාන්තා මීටර් 400**

1. කේ. ජයවර්ධන තත්පර 59.08 (වත්තල ලයිසියම් වි.), 2. ඩී.එම්. ගුණසිංහ තත්පර 59.84 කළුතර බාලිකා), 3. පී.එච්. අමායා මිනිත්තු 1:00.12 (රත්ගම දේවපතිරාජ වි.)

**18න් පහළ කාන්තා මීටර් 400**

එස්.පී.ඩබ්ලිව්. දෙව්මිණි තත්පර 50.00 (කොළඹ ආරක්ෂක වි.,) 2. එස්. භාග්‍යා (වත්තල ලයිසියම්), 3. යූ.එම්.එස්. හිමාෂනී තත්පර 58.59 (හැටන් අඹගමුව වි.)




20න් පහළ මීටර් 100 සහාය දිවීමේ නව තරග වාර්තාවක් බිහි කළ කොළඹ ආනන්ද ක්‍රීඩකයෝ



20න් පහළ උස පැනීමේ පළමු තැනට පත් (මීටර් 2.13) කොළඹ ආනන්ද විදුහලේ ජී.එල්. අර්ථවිදු



16න් පහළ කාන්තා හෙල්ල විසිකිරීමේ ඉසව්ව මීටර් 40.01කින් නිම කළ මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ කේ.බී.බී. ෂහේලී



18න් පහළ කාන්තා මීටර් 400 කඩුලු මතින් දිවීමේ තරගය මිනිත්තු 1:03.84කින් ජයගත් හැටන් අඹගමුව විදුහලේ එම්.එස්. හිමාෂානී



16න් පහළ පිරිමි තුන් පිම්ම මීටර් 13.65කින් ජයගත් නුගේගොඩ ලයිසියම් විදුහලේ ඒ. මිහිරංග



18න් පහළ පිරිමි මීටර් 400 කඩුලු මතින් දිවීමේ තරගය තත්පර 52.70කින් ජයගත් මහනුවර ත්‍රිත්ව විදුහලේ කේ.එච්. උයන්වත්ත හා තත්පර 53.52කින් දෙවැනි ස්ථානයට පත් එම විදුහලේම එම්.ඒ. රිෆායි අතර සටනක්

ඡායාරූප - කමල් වන්නිආරච්චි